## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

**2020/2021 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි III පරීක්ෂණය (2019 පුනර්) සහ ශාස්ත්‍රවේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි III පරීක්ෂණය (2018/2017/2015 පුනර්) (නව නිර්දේශය)**
**2025 ජුනි/ජූලි/අගෝස්තු**

### අපේක්ෂකයන් සඳහා උපදෙස්

- පරීක්ෂණය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථම කාල සටහනේ සඳහන් විභාග මධ්‍යස්ථානයට පැමිණිය යුතුය.
- පරීක්ෂණය සඳහා සහභාගී වීමේදී මෙම ප්‍රවේශ පත්‍රය සහ ශිෂ්‍ය වාර්තා පොත රැගෙන පැමිණීම අනිවාර්ය වන අතර එසේ නොමැති අපේක්ෂකයන්ට පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.
- විභාග අපේක්ෂකයන්ගේ දෙමාපියන් හෝ භාරකරුවන් කිසිම හේතුවක් මත විභාග මධ්‍යස්ථානය අසලට පැමිණීමෙන් වැළකිය යුතු අතර පරිශ්‍රය තුළට කිසිදු වාහනයක් ඇතුළු නොකළ යුතුය.
- විභාග පැවැත්වීම සම්බන්ධයෙන් සංශෝධිත නීති රීති ඇතුලත් පොත (By- Law) www.external.sjp.ac.lk වෙබ් අඩවියෙහි පල කර ඇත. ඒ සම්බන්ධයෙන් දැනුවත්ව පැමිණීම අනිවාර්ය වේ.
- ඔබට යම් රෝගී තත්ත්වයක් පවතී නම් වහාම විභාග නිරීක්ෂක නිලධාරියෙකුට හෝ විභාග ශාලාධිපතිට දැන්විය යුතුය.
- අවශ්‍ය ආහාර පාන තමා විසින්ම රැගෙන ආ යුතු අතර ඔබට අදාළ විභාග අවසන් වන තෙක් විභාග මධ්‍යස්ථානයෙන් බැහැරව යෑම නොකළ යුතුය.
- විභාග මධ්‍යස්ථානය පැවැත්වෙන භූමියේ වෙනත් පරිශ්‍ර වලට අනවශ්‍ය පරිදි ගමන් කිරීමෙන් වැළකිය යුතුය.
- පරිශ්‍රය තුළට කිසිදු අපද්‍රව්‍යයක් බැහැර නොකළ යුතුය. ඔබ අප සැමගේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කිරීම පිණිස සහාය වන්න.

### බාහිර උපාධි පරීක්ෂණ සඳහා නොපැමිණීමට හේතු/වෛද්‍ය වාර්තා/Absence Justification Form ඉදිරිපත් කිරීම සඳහා උපදෙස්

- මෙම පරීක්ෂණය සඳහා පළමුවර පෙනී සිටින **2020 සහ 2021 ශිෂ්‍ය කණ්ඩායම්වල අපේක්ෂකයන්ට සහ 2018/2019 ශිෂ්‍ය කණ්ඩායම්වල වෛද්‍ය වාර්තා (MC) ලෙස ප්‍රතිඵල ලේඛනයේ සඳහන් අපේක්ෂකයන්ට** පමණක් මෙවර පරීක්ෂණයට අයදුම් කර පෙනී සිටීමට නොහැකිවූයේ නම් පහත පරිදි වෛද්‍ය වාර්තා ඉදිරිපත් කළ හැකිය.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ**

**428 වැනි සනාතන සභාව විසින් අනුමත කරන ලද විශේෂ කරුණු**

**බාහිර අපේක්ෂකයන් සඳහා**

- රෝගී තත්ත්වයේ ස්වරූපය මත, අසනීප නිසා මුළු විභාගය හෝ විභාගයේ අදාළ කොටසකට හෝ පෙනී නොසිටින බාහිර විභාග අපේක්ෂකයන් ඒ බව විභාගය ආරම්භ වීමට අවම වශයෙන් **විනාඩි තිහකට පෙර** පෙර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය නිලධාරී වෙත වාර්තා කළ යුතු ය. ඊට අදාළ වෛද්‍ය සහතිකය පෙනී සිටීමට නොහැකි වූ මුළු විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී දින 14ක් ඇතුළත බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර/ ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

- නොවැළැක්විය හැකි හේතුවක් මත එසේ කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් එම හේතුව සනාථ කරමින් සාක්ෂි සමග තමා පදිංචි ප්‍රදේශයේ රජයේ ආරෝග්‍ය ශාලාවකින් ලබා ගත් වලංගු වෛද්‍ය සහතිකයක් පෙනී සිටීමට නොහැකි වූ මුළු විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී දින 14ක් ඇතුළත බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර/ ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

- පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර කරනු ලබන රජයේ පිළිගත් බටහිර, ආයුර්වේද හෝ හෝමියෝපති වෛද්‍යවරුන්ගෙන් ප්‍රතිකාර ලබාගන්නා අපේක්ෂකයෙකු තමා ලබාගත් වෛද්‍ය සහතිකය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී හමු වී ඔහු ලවා සහතික කරවා ගත යුතු ය. එම සහතිකය පෙනී සිටීමට නොහැකි වූ විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී දින 14ක් ඇතුළත බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර/ ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

1. බාහිර උපාධි පරීක්ෂණ සඳහා නොපැමිණීමට හේතු /වෛද්‍ය වාර්තා/Absence Justification Form ඉදිරිපත් කිරීමට අපගේ external.sjp.ac.lk යන වෙබ් අඩවියෙහි ඇති අයදුම්පත (සිංහල හෝ ඉංග්‍රීසි යන ඕනෑම මාධ්‍යයකින් ) බාගත කරගෙන නිවැරදිව සම්පූර්ණ කර ඒ සමග අමුණා පෙනී සිටීමට නොහැකි වූ විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී දින 14ක් ඇතුළත **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. (ඡායාපිටපත් ලඟ තබාගන්න)

2. ඉහත දක්වා ඇති 428 වන සනාතන සභාව මගින් අනුමත කරුණු හොඳින් කියවා බලා ඒ අනුව වලංගු වෛද්‍ය සහතික පමණක් ඉදිරිපත් කළ යුතුය. (ඉහත නිර්ණායකයන්ගේ යම් සංශෝධනයක් සිදුවේ නම් වෙබ් අඩවිය හරහා දැනුවත් කරනු ලැබේ).

3. කිසිදු අවස්ථාවක **විභාග මධ්‍යස්ථානයේදී සේවක භවතුන්ට** හෝ **පිළිතුරු පත්‍රය සමග අමුණා** හෝ **විභාග ප්‍රවේශ පත්‍රය සමග අමුණා විභාග ශාලාවේදී** හෝ භාර දීම **නොකල යුතුය.** එසේ භාරදෙන වෛද්‍ය වාර්තා සම්බන්ධයෙන් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වගකියනු නොලැබේ.

## සංශෝධිත විභාග කාලසටහන

| දිනය | පෙ.ව 9.00 - ප.ව 12.00 | ප.ව 1.30 - ප.ව 4.30 |
|---|---|---|
| 2025.06.21 **සෙනසුරාදා** | **BCGE 3001** - බෞද්ධ සංස්ථා අධ්‍යයනය | **BCGE 3002** - බෞද්ධ සාහිත්‍යය හා කලා ශිල්ප |
| 2025.06.23 **සඳුදා** | **ECGE 3001**- අද්‍යතන ආර්ථික ගැටලු | **ECGE 3002**- රාජ්‍ය ආර්ථික විද්‍යාව |
| 2025.06.25 **බදාදා** | **HIGE 3001**-ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය (ක්‍රි.ව. 1500 සිට ක්‍රි.ව. 1948 දක්වා) | **HIGE 3002**- යුරෝපා ඉතිහාසය (16වැනි සියවසේ සිට 20වැනි සියවස දක්වා) |
| 2025.06.28 **සෙනසුරාදා** | **ANGE 3001** -මානව විද්‍යාත්මක පර්යේෂණ ක්‍රම | **ANGE 3002** -ව්‍යවහාරික මානව විද්‍යාව සහ සංවර්ධනය |
| 2025.06.29 **ඉරිදා** | **ARGE 3001** - සම්භාව්‍ය වාස්තු විද්‍යාව හා නාණක විද්‍යාව | **ARGE 3002**- ස්මාරක සංරක්ෂණය සහ පුරාවිද්‍යා උරුම කළමනාකරණය |
| 2025.07.01 **අඟහරුවාදා** | **PHGE 3001** – සාමාන්‍ය මනෝවිද්‍යාව | **PHGE 3002**- ආචාර විද්‍යාව හා සමාජ දර්ශනය |
| 2025.07.02 **බදාදා** | **PAGE 3001**- ව්‍යාකරණ හා වාග් විද්‍යාව | **PAGE 3002**- අනිර්දිෂ්ට ග්‍රන්ථ හා ධර්ම විනය |
| 2025.07.03 **බ්‍රහස්පතින්දා** | **DRGE 3001**- නාට්‍ය නිර්මාණකරණය හා රංගභූමි ශිල්පය | **DRGE 3002**- නාට්‍ය රචනය හා විචාරය |
| 2025.07.05 **සෙනසුරාදා** | **GEGE 3001**- සංවර්ධනය හා සැලසුම්කරණය | **GEGE 3002**- තුලනාත්මක ප්‍රාදේශීය අධ්‍යයනය |
| 2025.07.06 **ඉරිදා** | **CRGE 3001**- සමකාලීන අපරාධ ප්‍රවණතා | **CRGE 3002** -අපරාධ පාලනය හා නිවාරණය |
| 2025.07.12 **සෙනසුරාදා** | **IRGE 3001**- ලෝක දේශපාලනයේ සමකාලීන අර්බුද | **IRGE 3002**- ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය |
| 2025.07.14 **සඳුදා** | **HNGE 3001**- හින්දි භාෂා ඉතිහාසය හා පරිවර්තන කලාව | **HNGE 3002**- හින්දි ජන සාහිත්‍යය හා උත්තර භාරතීය සංස්කෘතිය |
| 2025.07.16 **බදාදා** | **BPGE 3001**- බෞද්ධ මනෝ විද්‍යාව හා ආචාර විද්‍යාව | **BPGE 3002**- බුදු සමය හා සමාජ ගැටලු |

| දිනය | පෙ.ව 9.00 - ප.ව 12.00 | ප.ව 1.30 - ප.ව 4.30 |
|---|---|---|
| 2025.07.18 සිකුරාදා | **DAGE 3001-** ලෝක නර්තන සම්ප්‍රදායන් | - |
| 2025.07.21 සඳුදා | **POGE 3001-** දේශපාලන සමාජ විද්‍යාව | **POGE 3002-** රාජ්‍ය පරිපාලනය |
| 2025.07.25 සිකුරාදා | **SAGE 3001-** වෛදික හා බෞද්ධ සංස්කෘත සාහිත්‍යය | **SAGE 3002-** සංස්කෘත කාව්‍ය විචාරවාද හා භාෂා අධ්‍යයනය |
| | **ELAN 3001-** Linguistics2 Sociolinguistics, Psycholinguistics, Historical Linguistics | **ELAN 3002** – Discourse Analysis |
| 2025.07.26 සෙනසුරාදා | **SIGE 3001**- සම්භාව්‍ය සිංහල සාහිත්‍යය | **SIGE 3002**- සිංහල සංස්කෘතිය |
| 2025.07.27 ඉරිදා | **SOGE 3001** - සමාජ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රම | **SOGE 3002**- ප්‍රජා සංවර්ධනය පිළිබඳ සමාජ විද්‍යාව |
| 2025.07.28 සඳුදා | **CMGE 3001** - වෘත්තීය සන්නිවේදනය | **CMGE 3002** - ජනමාධ්‍ය හා සමාජය |
| 2025.07.30 බදාදා | **STGE 3001-** සමාජීය විද්‍යාවන් සඳහා සංඛ්‍යාන ක්‍රම | **STGE 3002-** ප්‍රායෝගික සංඛ්‍යානය |
| 2025.08.01 සිකුරාදා | **CUGE 3001** - ශ්‍රී ලාංකේය ජන සම්ප්‍රදාය | **CUGE 3002-** ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතිය |
| 2025.08.02 සෙනසුරාදා | **GENG 3005** - English for General Purposes (2020/2021) | **GEIT 3001** - Data Visualizations and Management (2020/2021) |
| 2025.08.03 ඉරිදා | **PSGE 3001-** ප්‍රජානන මනෝවිද්‍යාව | **PSGE 3002-** කාර්මික මනෝවිද්‍යාව |

**<u>ප්‍රායෝගික පරීක්ෂණ</u>**

| දිනය | පෙ.ව. 9.00 - ප.ව. 4.30 |
|---|---|
| 2025.08.09 සෙනසුරාදා සහ 2025.08.10 ඉරිදා | **MUGE 3001 -** උත්තර භාරතීය ශාස්ත්‍රීය සංගීතය ප්‍රායෝගික III (ගායනය) |
| | **MUGE 3002 -** රබීන්ද්‍ර සංගීතය හා ශ්‍රී ලාංකේය ජන සංගීතය |
| | **MUGE 3003 -** උත්තර භාරතීය ශාස්ත්‍රීය සංගීතය ප්‍රායෝගික III (වාදනය) |
| 2025.08.09 සෙනසුරාදා සහ 2025.08.10 ඉරිදා | **DAGE 3002** - නර්තන ප්‍රයෝගික III (උඩරට/පහතරට /සබරගමු) |

**<u>සැලකිය යුතුයි :</u>**

- මෙම පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබනුයේ **2020/2021 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි III පරීක්ෂණය (2019 පුනර්) සහ ශාස්ත්‍රවේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි III පරීක්ෂණය (2018/2017/2015 පුනර්) (නව නිර්දේශය) 2025 ජුනි/ජූලි/අගෝස්තු** පරීක්ෂණයට පෙනී සිටීමට අවශ්‍ය සියලු කරුණු සම්පූර්ණ කර කර **2025.04.25** දිනට පෙර අයදුම්පත් යොමු කර ඇති සිසුන් පමණි.

- ඔබට අදාළ විභාග ප්‍රවේශ පත්‍රය **2025.06.13** දින සිට **external.sjp.ac.lk/Academics/Exam Admissions** වෙත පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය V අක්ෂරය රහිතව ඇතුලත් කිරීමෙන් ලබාගත හැකි අතර **<u>විභාග ප්‍රවේශපත් තැපැල් මාර්ගයෙන් නිකුත් නොකරන බව කාරුණිකව සලකන්න.</u>**

- මෙම පරීක්ෂණය කොළඹ දිස්ත්‍රික්කයේ විභාග මධ්‍යස්ථානවලදී පමණක් පැවැත්වේ. **ඔබගේ ප්‍රවේශ පත්‍රයේ විභාග මධ්‍යස්ථාන කේතය සහ පසුපිටෙහි සඳහන් විභාග මධ්‍යස්ථානය ඉතා අවධානයෙන් පරීක්ෂා කර ඔබට නියමිත විභාග මධ්‍යස්ථානය වෙත පැමිණෙන්න.**

- **පරීක්ෂණය සඳහා සහභාගී වීමේදී අත්සන සහතික කරන ලද විභාග ප්‍රවේශ පත්‍රය, ශිෂ්‍ය වාර්තා පොත සහ ජාතික හැඳුනුම්පත රැගෙන පැමිණීම අනිවාර්ය වන අතර එසේ නොමැති අපේක්ෂකයන්ට පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. එසේම විභාග මධ්‍යස්ථානයට ඇතුල්වීමට අවසර ඇත්තේ විභාග අපේක්ෂකයන්ට පමණි.**

- මෙම පරීක්ෂණයෙහි සහ විභාග මධ්‍යස්ථානයන්හි යම් සංශෝධනයක් වුවහොත් **www.externel.sjp.ac.lk** වෙබ් අඩවිය හරහා පමණක් දැනුවත් කරනු ලැබේ.



ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි/ විභාග
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2025.07.08